## 5. කලාඳුරු

විද්‍යාත්මක නම : *Cyperus rotundus*



**ලක්‍ෂණ :** බහු වාර්ෂික පන් ශාකයකි. පස තුල ඇති රෙරෙසෝම වලින් හට ගන්නා අතු සමහරක් ධාවක බවට විකරණය වේ. මෙම ධාවක මහත් වී ආකන්ධ සාදයි. ධාවක ලපටි අවස්ථාවේදී සුදු පැහැ ගනී. සිහින් තද කොළ පැහැ පත්‍ර පිහිටයි. තරමක් ඉහළට වැඩුනු පුෂ්ප මංජරියක් පිහිටයි.

**පුෂ්ප මංජරිය :** රතු දුඹුරු පැහැ සංයුක්ත ඡත්‍රයකි.







**ප්‍රචාරණය :** ප්‍රධාන ප්‍රචාරණ ක්‍රමය භූ කඳන්ය. ඊට අමතරව බීජ මඟින් ද ප්‍රචාරණය වේ. මර්ධනය කිරීමට අපහසු වල් පැළෑටියකි. පස තුළ ගැඹුරට වැඩුනු මුල් පද්ධතියක් ඇති නිසා අධික වියලි කාල වලදී ද විනාශ නොවේ.

**පරිසරය :** මඩ සහිත කුඹුරු වල ව්‍යාප්තිය ඉතා අඩු අතර වියලි කුඹුරු වල බහුලව දක්නට ඇත. වියලි ගොඩබිම ආශ්‍රිතව දක්නට ලැබෙන වල් පැළෑටියකි. ගැඹුරට සී සෑම මඟින් ධාවක කොටස් මතු වී වියලී යෑම නිසා සෑහෙන දුරකට මර්ධනය කල හැක.


**විෂය කරුණු**

1. ජේ. පොන්නම්පෙරුම ආරච්චි
(පර්යේෂණ නිළධාරී)

2. අනුරුද්ධිකා අබේසේකර
(පර්යේෂණ නිළධාරී)

3. සී.ජේ. බමුණුවිතාරණ
(පර්යේෂණ සහකාර)

**වී පර්යේෂණ ස්ථානය - ලබුදූව**
**වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය - බතලගොඩ**



Designed & Printed by : AUDIO VISUAL CENTRE, Department of Agriculture


## පහතරට තෙත් කලාපයේ වී වගාවේ බහුලව දක්නට ලැබෙන

# පන් වර්ග




**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි**
**2014**

## 1. තුනැස්ස

විද්‍යාත්මක නම : *Cyperus iria*





ලක්ෂණ : වාර්ෂික පන් ශාකයකි. පඳුරක් ලෙස වැඩෙන අතර තන්තුමය රතු පැහැයට හුරු මුල් පිහිටයි. කඳ පැතලිය. ත්‍රිකෝණාකාරය. පත්‍ර තලය රේඛීය ලන්සාකාර වේ.

පුෂ්ප මංජරිය : සංයුක්ත ඡත්‍රයකි

ප්‍රචාරණය : බීජ මගින්

පරිසරය : මඩ සහිත කුඹුරු වල බහුලව දක්නට ඇත. තෙත් සහ වියලි තත්ත්ව දෙකටම අනුවර්තනය වී ඇත. ගොඩ ඉඩම් වල ද දක්නට ලැබේ.

## 2. බෝල තුනැස්ස (මෝට්ටු)

විද්‍යාත්මක නම : *Cyperus difformis*







ලක්ෂණ: වාර්ෂික පන් ශාකයකි. පඳුරක් ලෙස වැඩෙයි. කඳ මෘදුය. පත්‍ර කඩා හැලෙන ස්වභාවයක් ගනී.

පුෂ්ප මංජරිය : සරල හෝ සංයුක්ත ඡත්‍රයකි. ගෝලාකාර හැඩයක් ගනී. කොළ පැහැතිය. පරිනත වන විට කහ කොළ වර්ණයක් ගනියි.

ප්‍රචාරණය : බීජ මගිනි. අධික බීජ ප්‍රමාණයක් නිපදවයි.

පරිසරය: තෙත් කලාපයේ සහ වියලි කලාපයේ දක්නට ඇත. මඩ සහිත කුඹුරු වල පවතින ප්‍රධාන වල් පැළෑටියකි.

## 3. හීන් කුඩමැට්ට

විද්‍යාත්මක නම : *Fimbristylis milicea*



ලක්ෂණ : වාර්ෂික පන් ශාකයකි. උසට සෘජුව පඳුරක් ලෙස වැඩෙයි. කඳ දුර්වලය. පාදස්ථය පැතලිය.

පුෂ්ප මංජරිය : ඡත්‍රයකි. ශූකිකා දුඹුරු පැහැති ගෝලාකාර හැඩ ගනියි.



ප්‍රචාරණය: බීජ මගින්

පරිසරය : තෙත් වියලි පරිසර දෙකෙහිම පවතී. කුඹුරෙහි සහ නියර ආශ්‍රිතව වැඩෙන ප්‍රධාන වල් පැළෑටියකි.

## 4. කුඩමැට්ට

විද්‍යාත්මක නම : *Scirpus supinus*





ලක්ෂණ : උසට සෘජුව වැඩෙන වාර්ෂික පන් ශාකයකි. පත්‍ර ස්වල්පයකි. කඳ සිලින්ඩරාකාරය.

පුෂ්ප මංජරිය : ශූකිකා 3-7ක් සහිත අන්ඩාකාර හැඩති ශීර්ෂ වේ.

ප්‍රචාරණය : බීජ මගින්

පරිසරය : තෙත් කලාපයේ සහ වියලි කලාපයේ කුඹුරුවල දක්නට ලැබේ. අස්වැන්න අඩු වීම කෙරෙහි අධික ලෙස බලපායි.